20/03/2012 - ලංකාදීප

**ජිනීවා අභියෝගය - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 19 වැනි සැසිවාරයට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. අද එය රට තුළ සාකච්ඡාවට ප්‍රධාන මාතෘකාවක් වී ඇත. ත්‍රස්තවාදයෙන් මිදී සාමකාමී සමාජයක් ප්‍රාර්ථනා කරමින් සිටි මහජනතාව අද සිදුවෙමින් පවතින ජාත්‍යන්තර බලපෑම් දෙස බලන්නේ මහත් විමතියෙනි. එදිනෙදා මුහුණ දෙන ගැටලු හමුවේ ආවේගයෙන් සිටි ලාංකිකයන් රට වෙනුවෙන් අද එකමුතු වී ඇත. එම යෝජනාව පරාජය කිරීමේ අදිටනින් රජයත්, රට වැසියනුත් හැසිරෙන බව පෙනේ. මානව හිමිකම් කවුන්සිලය, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ සාකච්ඡුා සභාවකි. රටකට එරෙහිව තීන්දු තීරණගැනීමේ නීතිමය බලතල එයට නැත. එහෙත්, එය ප්‍රවේශයකි. මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම් වලට අනුව අත්සන්කරන ලද රටවල් කටයුතු කරතැයි විමසිලිවත්වීමට අයිතියක් කවුන්සලයට තිබේ. නමුත් සිදුවන්නේ name and shame තත්ත්වයකි. යෝජනාව ඉදිරිපත් කර ජාත්‍යන්තරය ඉදිරියේ අදාල රටවල් අපහසුතාවට පත් කිරීමකි.

කවුන්සිලයට ඉදිරිපත් කර ඇති යෝජනාව අනුව ශ්‍රී ලංකා රජය උගත් පාඩම් හා ප්‍රතිසංධාන ජනාධිපති කොමිසමේ යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. එය කාල රාමුවක් තුළ සිදුකළ යුතුය. මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර නීති කඩ වී ඇති දැයි සොයා බලයි. ජගත් මානව හිමිකම් කවුන්සිලයෙන් උපදෙස් දීමට සහ ලබාගැනීමටත් ලබන වසරේ කවුන්සිලයට වාර්තාවක් ඉදිරිපත්කළ යුතු බවත් කියැවෙයි.

මානව අයිතිවාසිකම් පදනම් කරගෙන, නිදහස් රාජ්‍යයක අභ්‍යන්තර තත්ත්වයට එරෙහිවතීරණ ගැනීමේ අයිතියක් තිබේද? එයට අවනත වුවහොත් එතැනින් දොරටුව විවර කරගන්නා ඔවුන් ශ්‍රී ලංකාව තමන්ට රිසි පරිදි මෙහෙයවන රටක තත්ත්වයකට පත් කර ගනු ඇති ද යන්න සමාජයේ විශේෂ අවධානයට ලක්ව ඇත. ඉරාකයට හෝ ඇෆ්ගනිස්ථානය වැනි රටවල ට ඇතුල් වී සමහර බටහිර රටවල් ක්‍රියා කළ ආකාරය මෙරටට ද අනුගමනය කරනු ඇතැයි බියක් ඇති බව පෙනේ. මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරන යෝජනාව ට පක්ෂ හා විපක්ෂ රටවල් සිටී. මෙම සටනින් ජයගත හැකි වන්නේ එක කණ්ඩායමකට පමණකි. පරාජය වන රටවල් ශ්‍රී ලංකාව ප්‍රකෝපයට පත්වනු ඇත. සියලූ දෙනා එකතු කරගෙන පොදු අදහසකට යාම අපගේ උපාය විය යුතුය. එකම මිතුරුයායක් විය යුතු ජාත්‍යන්තර ප්‍රජාව අතර රටට හිතවත් නැති කණ්ඩායමක් තෝරා ගැනීමේ ද්වන්ධ අරගලයකට වඩා, උද්ගත වී ඇති තත්ත්වය සමාලෝචනය කර සියලූම දෙනා එක මතයකට, එක කුලකයකට එකතු කිරීම වැදගත්ය. ත්‍රස්තවාදයෙන් මිදී සාමකාමී සමාජයක් ගොඩනගන අවස්ථාවක, ජාත්‍යන්තර ප්‍රජාව එකතු කර වර්තමානයේ ඔවුන් සතු යුතුකම අවබෝධකරදීම ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික කාර්ය භාරයයි. ප්‍රශ්නය හමුවේ නම්‍යශීලීත්වය වැදගත්ය. එහෙත් එය දුර්වලකමක් සේ නොපෙනෙන්නට වගබලාගත යුතුය. කවුන්සිලයට රටට එරෙහිව තීරණ ගත නොහැකිය. එවැනි තීරණයක් ගත හැකි එක්සත් ජාතීන්ගේ හෝ ආරක්ෂක කවුන්සිලයේ තීරණයකින් පමණකි. ලෝකයේ දැන් ඇති අර්බුද දෙස බලන විට රට පිළිබඳව ඉදිරිපත්ව ඇති යෝජනාව එවැනි දුර ගෙනයන්නට ඉඩ කඩ අඩුය. මෙම යෝජනාව සාකච්ඡාවේදී ඇතිවන තත්ත්ව අනුව සාමාජික රටවල් ස්වාධීනව තීරණ ගන්නට ඉඩ තිබේ. එවැනි තැනකට පොළඹවන්නට රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර මාධ්‍ය ට ඇති හැකියාව සුළු කොට තැකිය නොහැකිය.

ත්‍රස්තවාදය, සෞඛ්‍ය, දරිද්‍රතාව, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය වැනි එකකට එකක් නොදෙවෙනි මාතෘකා ලෝකය පුරා ඇත. ඒවා තීරණාත්මකය. එය අතරට රටක මානව හිමිකම් වැනි සාධකයක් මතුවීමට යම් පදනමක් තිබිය යුතුය. එම පදනම සොයා ගැනීම හා අවබෝධයක් ලබා ගැනීම ද අපට වැදගත්ය.

යුගයෙන් යුගය සමාජ ධර්මතා වෙනස්වෙයි. ඒවා සමාජ වටිනාකම්ය. මනුෂ්‍යයා ආගමික සදාචාරයට යටත්වන විට, ආගම් හි දැක්වෙන උසස් ගුණාංග සමාජයේ ඉහළ පිළිගැනීමට ලක්වෙයි. මේවා ප්‍රමිති වශයෙන් සමාජයන්හි ගරුත්වයට පාත්‍රවෙයි. යටත් විජිත සමයේ මෙවැනි ප්‍රමිති සකස් වූයේ ක්‍රිස්තියානි ආගමෙහි එන දැක්ම අනුවය. එක් එක් කාලයේ මෙවැනි ප්‍රමිති, බෞද්ධ, හින්දු ඉස්ලාම්, හෝ වෙනත් ආගම් වල උසස් දර්ශන වලින් ද උකහා ගෙන ඇත. අද මේවා විශ්ව සාධාරණ ගුණාංග බවට පත්ව තිබේ. එදා මෙම ගුණාංග භූගෝලීය කලාප වශයෙන් වෙන් වෙන්ව තිබෙන්නට ඇත. නමුත් වර්තමානය තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධය. ගෝලීයකරණ සමාජයකි. සමාජය ගෝලීයකරණය වී තිබේ. ගරු කළ යුතු ආර්ථික සාමාජ ධර්මතා හෝ සමාජ වටිනාකම් ලෝකය පුරා පොදු පිළිගැනීමට ලක්වෙයි. එය පුලුල් හා සියුම් තත්ත්වයකි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීමට තුඩු දුන් පසුබිම, පසුව ලෝක වාසීන්ගේ මානුෂික තත්ත්ව අවධානයට ගෙන විශ්ව සාධාරණ ප්‍රකාශනයක් එළි දැක්වීය. එය තවත් පැතිරෙමින් responsibility to protect - R2P නම් ''ආරක්ෂා කිරීමේ වගකීම'' යන ප්‍රතිපත්තිය සකස් වී තිබේ. එය නූතන සමාජ වටිනාකම් සම්බන්ධ එක්තරා මිනුම් දණ්ඩකි. ජාත්‍යන්තර ප්‍රජාව එයට සම්පූර්ණයෙන් ම එකග නැත. ටිබෙට් ප්‍රශ්නය හමුවේ තමන් හිරිහැරයට පත්වනු ඇතැයි කල්පනා කළ චීනය එයට කැමැත්තක් දැක්වූයේ නැත. රුසියාව එයට එකග නොවූයේ චෙච්නියානු අර්බුදය හෙයින්ය. අමෙරිකාව මෙය තමන් ගේ ග්‍රහනයට එන සම්ප්‍රදායක් යැයි කල්පනා කළේය. මෙය නීතියක් නොවේ. මනුස්ස ප්‍රජාව ආරක්ෂා කර සියලූ දෙනාගේ උන්නතිය වෙනුවෙන් පෙනී සිටීමේ සංකල්පයකි.

විනාශයට ගොදුරුවන මිනිසුන් ගේ රැකවරණය වෙනුවෙන් ''ආරක්ෂා කිරීමේ වගකීම'' සඳහා පෙළැඹවීම ආණ්ඩු මට්ටමින් මතු වූවක්, නොවේ. එය පුද්ගල අයිතින් හා සමාජ සුරක්ෂිත භාවය වෙනුවෙන් පෙනී සිටින පොදු ජන සංවිධානවල උවමනාව අනුව බිහිවූවකි. මහජනතාව ආරක්ෂා කරන්නට ආණ්ඩු උනන්දු නැතැයි යන මතය එයට පාදක විය. 1993 දී රුවන්ඩාවේ ගෝත්‍රික සටන් එයට උල්පතයි. බුද්ධික සමාජය කිසිසේත් අනුමත නොකරන ආකාරයේ කුරිරු ඝාතන රුවන්ඩාවේ සිදුවිය. එය බලය උදෙසා ගෝත්‍ර අතර යුද්ධයකි. රටවැසියන්ට ම එරෙහිව සිදුවූ අතර එයින් ලක්ෂ අටක පමණ මනුෂ්‍ය සංහාරයක් සිදුවූ බව ජාත්‍යන්තර වාර්තා කියයි. එය ශ්‍රී ලංකාවේ සිදුවූ ත්‍රස්තවාදය මර්දනය කර සාමකාමී ජන ජීවිතයක් ඇතිකිරීමේ මානුෂික මෙහෙයුමට වඩා හාත්පසින්ම වෙනස් ගැටුමකි. මෙරට සිදුවීම් වලට එය සමාන කිරීම කිසිසේත් කළ නොහැකිය. එකී සිදුවීමට ලෝක බලවතුන් මැදිහත් නොවීම පසුකාලීනව මහත් විවේචනයට ලක්විය. අහිංසක ජනතාව ඝාතනය වන අතර ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග වෙනුවෙන් පෙනී සිටින දියුණු සමාජය එය නොතකා හැරීම විශ්ව සාධාරණ ගුණාංගයක් නොවන බවට බරපතල චෝදනා නැගින. එහි ප්‍රතිඵලයක් වූයේ තත්ත්වය සොයා බලා විමර්ෂණය කරන විවිධ පාර්ශව මනුෂ්‍යත්වය ආරක්ෂා කිරීම උදෙසා නොයෙක් යෝජනා ඉදිරිපත් කිරීමයි. සියලූ පැති ගැඹුරින් නිරීක්ෂණය කළ ජගත් සංවිධානය ''ආරක්ෂා කිරීමේ වගකීම'' සම්බන්ධ රාමුව 2000 වසරේ දී සකස් කළේය. එය සම්මුතියකි. රටවල් තුළ සිදුවන සිද්ධි විශ්ලේෂණය කරන අවස්ථාවකි. ඇතැම් රටවල් සාමාජිකත්වය නොගත් නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඇතුලත් රටවල් සෑහෙන ප්‍රමාණයක් එයට එක`ගත්වයකට එළැඹින.

එයට මූලික කරුණු තුනක් ඇතුලත්ය. '' ඕනෑම රටක් තම පුරවැසියන් භීෂණකාරී ඝාතන වලින් ආරක්ෂා කරගත යුතුය'' යන්න එහි පළමු කාරණයයි. එම ''අරමුණ සාක්ෂාත් කරගන්නට නොහැකි බව පෙනෙන අවස්ථාවක එයට සහාය වීමට ජාත්‍යන්තර ප්‍රජාවට අයිතියක් ඇත'' යන්න දෙවැනි වගන්තියේ හරයයි. තෙවැන්න, ''එකී උත්සාහය ද අසාර්ථක වන අවස්ථාවක ජාත්‍යන්තර ප්‍රජාවට එකී රටට ඇතුල් වී ආර්ථික බලපෑම් මගින් හෝ හමුදා මැදිහත්වීමකින් සාමාන්‍ය ජනතාව ආරක්ෂා කරගත යුතු'' බව තුන්වැනි

කාරණයයි. යුගෝස්ලාවියාවේ ඇතිවූ තත්ත්වයට ජාත්‍යන්තර ප්‍රජාව මැදිහත්විය. එය ස්වකීය පැවැත්මට ගැලපෙන බව තෝරාගත් අප්‍රිකානු එකමුතුවේ රටවල් තම ව්‍යවස්ථාවට ''ආරක්ෂා කිරීමේ වගකීම'' හෙවත් ඍජු සම්ප්‍රදාය ඇතුලත් කරගෙන ඇත.

රුවන්ඩාවේ සිදුවීම් රටක් තුළ සිදුවන ඝාතන සම්බන්ධව ජගත් අවධානය යොමු වූ තීරණාත්මක මොහොතකි. ත්‍රස්තවාදය ට එරෙහිව ලෝක අවධානය තියුණු වන්නට ඇමරිකාවට ප්‍රහාර එල්ල වූ 9-11 සන්ධිස්ථානයක් වූ සේය. ජීවිතයක් යනු ජීවිතයකි. එය කොතැන කොයි ආකාරයට අහිමි වුවද ඛේදජනකය. නමුත් රටක් තුළ සිදුවීම් හා රටවල් අතර ගැටුම් වෙන්කර හඳුනා ගැනීමට පිළිගැනීම් ඇත. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයක් තිබේ. එහි යුද නීති ඇත. යුද්ධ අවස්ථාවක අනුගමනය කළ යුතු මූලික ප්‍රතිපත්ති ගැන පිළිගත් හමුදා විනයක් තිබේ. රටක් තුළ සිදුවන සිද්ධි රටවල් අතර සිදුවන ගැටුම් වලට වඩා වෙනස් එකකි. ඕනෑම තත්ත්වයක් යටතේ රටක පාලකයන්ට තම පුරවැසියන් ආරක්ෂා කර ගැනීමේ වගකීමක් තිබේ. වරද සොයා දඬුවම් කරන නීති හා විධිවිධාන ඕනෑම රටකට ඇත. ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය අභ්‍යන්තර එකකි. එය රටවල් දෙකක් අතර සිදුවූවක් නොවේ. ඉරාකයට, ඇෆ්ගනිස්ථානයට හෝ වෙනත් රටකට එරෙහිව ඇමරිකානු හමුදා එල්ල කළ යුද්ධය රටවල් අතර එකකි. එහි තත්ත්වය පාලනය කරන්නට වෙනම නීතියක් ඇත. නමුත් ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළ තමන්ගේම පුරවැසියන් අතර සිදුවූ ගැටුමකි. ත්‍රස්තවාදය පරාජය කළ යුතුය. ඒ ගැන විවාදයක් නැත. ජගත් ප්‍රජාව එයට ඉඩදුන්නේය. තමන් ආරක්ෂා කරගත යුතු, අහිංසක පුරවැසියන්, රට තුළ සිදුවූ ගැටුම් වලින් මිය ගියේ ද, නොඑසේනම් මානව හිමිකම් හෝ සිවිල් අයිතීන් කඩ වී දැයි සොයා බලන්නට සමාජ වටිනාකම් වලට ගරු කරන ප්‍රජාව මහන්සි වෙමින් තිබේ. අපට ද එයට උනන්දුවක් තිබුණි. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම පත් කළේ එයටය. එහි වාර්තාවට අනුව රජය හෝ ආරක්ෂක හමුදාව ප්‍රතිපත්තියක් වශයෙන් සිවිල් ජනතාව උවමනාවෙන් ඝාතනය නොකළ බව එම වාර්තාව අනාවරණය කරයි. එය රටට වැදගත්ය.

මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාව පිළිබඳව යෝජනාවක් ගෙන ඒම රට බරපතල අපහසුතාවයකට පත් කිරීමකි. ත්‍රස්තවාදය පරාජය කරන මානුෂික මෙහෙයුමේ දී සාමාන්‍ය ජනතාවට අවම වශයෙන් හානියක් නොවන්නට ආරක්ෂක අංශ වෙහෙසුන බව දන්නේ අප සමාජයයි. මානුෂික මෙහෙයුම අවස්ථාවේ ජනතාව මිනිස් පලිහක් කරගන්නට ත්‍රස්තවාදීන් ප්‍රයත්න දැරූ ආකාරය රටට අමතක නැත. ත්‍රස්තවාදීන් කොටුකර සාමාන්‍ය ජනතාවට දොරටු විවර කළ අවස්ථාවේ දී ගැටුම් සහිත කලාපයේ කොටුවී සිටි දස දහස් ගණන් ජනතාව ආරක්ෂක හමුදාවේ සෙවන සොයා පැමිණි බව රහසක් නොවේ. ඔවුන් අද රැකවරණය සහිතව නැවත ගම්බිම් වල යළි පදිංචි කිරීමේ මෙහෙවර ඉටුකරන්නේ ද ආරක්ෂක අංශයයි. ත්‍රස්තවාදීන් අහිංසක ජනතාව ඝාතනය කළ අතර ළමා සොල්දාදුවන් බඳවා ගනිමින් අමානුෂික අන්දමට ක්‍රියා කළේය. බිම් බෝම්බ අතුරමින් පොදු ප්‍රවාහන සේවා හා සිවිල් ජනතාව ගැවසෙන ස්ථාන ඉලක්ක කරගනිමින් මහා පරිමාන ඝාතන කළේය. සත්‍යය එය නමුත් කුඩා රටකට තමන් මුහුණ දුන් පීඩනය නිවැරදිව ජගත් ප්‍රජාව වෙත සන්නිවේදනය කිරීම පහසු නැත. රටේ ජනතාව ඝාතනයට ලක්වූ හෙයින් ත්‍රස්තවාදී ක්‍රියාවන්ට නැඹුරු වූ වෙනත් ජන කණ්ඩායමක් ඝාතනය කරන්නට සිදුවූ බව ප්‍රජාතන්ත්‍රවාදී රටකට ප්‍රකාශ කළ නොහැකිය. එය මෙම කවුන්සිලයේ යෝජනාව සමග තේරුම්ගත යුතු යථාර්ථයයි. ලෝකය සාධාරණ නැත. එහි බලවතා නැගී සිටින අතර කුඩා රටකට සිදුවන්නේ එහි නියමයන්ට අවනතවීමය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය හමුවට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෝජනාවක් ගෙනඑන්නේ රට තුළ සිදුවන සිද්ධීන්ට මැදිහත්වීමේ ලෝක අයිතිය සාධාරණ බව ඔප්පු කිරීමේ අරමුණ ඇතිවය. ජගත් ප්‍රජාවට එයට අයිතියක් තිබේ. එය පිළිගන්නා අතර ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් කඩවන හා උසස් මානුෂික ගුණාංග විනාශ කරන කිසිවක් සිදු නොවූ බව පැහැදිලිව පෙන්වීමේ අයිතිය අපට ඇත. වැදගත් වන්නේ එකී අරමුණ ඉටු කර ගැනීමට ගන්නා උපාය

මාර්ග මගින් රටේ කීර්තිය වැඩි කරන අතර අප උසස් මානුෂික ධර්මතා සහිත පිරිසක් බව ඔප්පු කිරීමයි. සාකච්ඡාවෙන්, සංවාදයෙන් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීමට තරම් බුද්ධියක් ඇති බව ක්‍රියාවෙන් පෙන්වාදීමයි. රටට එරෙහිව කදවුරු බදින සමාජයට වඩා උසස් ප්‍රමිතීන් අප සමාජයට ඇති බව නොකියා කියා සිටීමයි. බුද්ධ දේශනාව අනුව සමගියෙන් රැස්වී, සමගියෙන් සාකච්ඡා කර සමගියෙන් විසිර යන දර්ශනය ඉදිරිපත් කර තිබේ. බදු දහමට ගරු කරන රටක් වශයෙන් එකී හරය ඔප්පු කරන්නට අපට හැකියාවක් ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව මානව හිමිකම් නවුන්සිලය බිහිවූයේ එවකට පැවති මානව හිමිකම් කොමිසම ට විකල්පයක් වශයෙන්ය. කොමිසම ලෝක පැවැත්මට හා  මනුෂ්‍ය සංහතියේ යහපතට ඉටුකළ කාර්ය භාරය වැදගත් එකක් නොවන බවට වූ විවාදයෙන් පසු කවුන්සිලය නිර්මාණය විය. එක්සත් ජාතීන්ට අයත් සාමාජික රටවලින් සාමාජිකයන් හතලිස් හතක් පිට පිට දෙවතාවක් පත් නොවන සිවු අවුරුදු කාලසීමාවකට මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකත්වයට පත්වෙති. මෙම කවුන්සිලය ජිනීවා හි දී රැස්වන්නේ ලෝකයේ නව ප්‍රවනතා සාකච්ඡා  කර එහි පසුබිම තේරුම් ගැනීමේ අරමුණෙන්ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට රටක් සම්බන්ධයෙන් පොදු තීරණයක්ගත් අවස්ථාවේ යම් යම් සම්බාධක පනවන්නට බලය ඇතත් මෙම කවුන්සලයට එවැනි හැකියාවක් නැත. අවුරුදු හතරකට  වරක් ලෝකයේ සෑම රටකම මානුෂික වටිනාකම් සොයා බලා රටක තත්ත්වය අනාවරණය කිරීමට පූර්ව වශයෙන් මෙම කවුන්සලය සාකච්ඡා  පවත්වයි. එක් එක් නියෝජිතයන්ද, යෝජනාව ඉදිරිපත්වූ රටේ නියෝජිතයන්ට ද තම රට ගැන සැබෑ තත්ත්වය පෙන්වා දෙන්නට පුලුල් අවස්ථාවක් එහි තිබේ. අසාධාරණය ඔප්පු කරමින්  යෝජනාව සම්පූර්ණයෙන් ම පරාජය කරන අවස්ථාවක දී මානව හිමිකම් හෝ මූලික මිනිස් ගුණාංග වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් පරාජය විය හැකිය. ඔවුන් නගන චෝදනා වල යථාර්ථය දක්වන අතර මූලික ගැටලූ වලට ඔවුන්ගේ අරමුණ ඉටු නොවීමෙන් අනපේක්ෂිත තත්ත්වයක් ද ඇතිවිය හැකිය. එය මිනිස් ධර්මතා වලට පොදු එකකි. තමන්ට සගවන්නට දෙයක් නැතිනම් එයට මුහුණ දීම නුවණට හුරුය. එනමුත් සාමාන්‍යයෙන් මෙරට පොලීසියක මෙන්, පුද්ගලයෙකු පොලිසියට කැදවුවහොත් වරදක් හදා හෝ විත්තිකරුවෙකු කළ හැකිය. ලෝක ස්වභාවය මෙයයි. රටවල් අතර තත්ත්වය ද එයට නොවෙනස්ය. පොලිසිය වැරදි බව කියමින් වරෙන්තුව මග හැරීම චෝදනා වලින් නිදහස්වීමක් නොවේ.

1983 ජූලි කලබල වලින් පසු රටට හිතකර නැති ඩයස්පෝරාවක් ජාත්‍යන්තරයේ ජීවත්වෙති. ඔවුහු ඉතා සූක්ෂම ආකාරයට රටට එරෙහිව තොරතුරු රැස් කරති. මානව හිමිකම්, මාධ්‍ය නිදහස, දේශපාලන ප්‍රචණ්ඩත්වය, සිරකරුවන් අමානුෂික ලෙස සැලකීම් වැනි නොයෙකුත් දේ සම්බන්ධයෙන් රටවල දත්ත එකතුකර මත ගොඩනගති. රට හැර යන්නට සිදුවූ දෙමල ජන කොටස අප රටේ ම ජන කන්ඩායමක් නමුත් ඔවුන් අද ක්‍රියා කරන්නේ අතීත සිදුවීම් වලට පලිගැනීමේ ආකල්පයෙනි. එය අන්තවාදීය. ඒඅ ය සමග ගනුදෙනු කර මැද මාවතේ සිටින යම් කොටසක් දිනා ගත හැකිය. සම්පූර්ණයෙන් ම නොවේ. මෙරට පාලකයන්ට ඩයස්පෝරාවේ ක්‍රියාකලාපය දේ සාධාරණ නැත. එකිනෙකට වෙනස් මත මගින් මනුෂ්‍ය ආකල්ප කුපිතකර නීති ගරුක පාලනය අවුල් කරන්නටත්, ඒ ඔස්සේ බලපෑම් කරන්නටත් සූදානම් වන විට, මහත් වෑයමෙන් මහජන මතය දිනාගෙන බලයට පත්වන ආණ්ඩු අපහසුතාවට පත් වෙයි. එය වාසියක් බවට පත්කරගන්නා මෙකී සමාජය මෙවැනි ප්‍රකෝප හා සංයමයක් නැති පාලනයකින් මහජනතාවට යුක්තිය ඉටු නොවෙන බව හඬගා පෙන්වා දෙති. රාජ්‍ය පාලනය සුන්දර නැති බව පෙනෙන්නට තවත් සාධක අවශ්‍ය නැත. මෙවැනි දේ දරාගෙන, උපායශීලීව ජාත්‍යන්තර මත වලට මුහුණ දෙන්නටත් සමත් පරිනත බවක්  ඕනෑම රටකට අවශ්‍යය.

මානව හිමිකම් කවුන්සලයේ දී දී ශ්‍රී ලංකාවට ඉන්දියානු සහාය ලැබේ ද යන්න විවාදයට තුඩු දුන් කරුණකි. ඉන්දියාව අප රටට තර්ජනයක් නොවේ. කලාපීය බලවතා වශයෙන් ඉන්දියාවේ ස්ථාවරය රටට වැදගත්ය. ඉන්දියාවට විසදාගැනීමට ප්‍රශ්නයක් තිබේ. ක්‍රමයෙන් වැඩෙන ප්‍රාන්ත දේශපාලනය, බලවත්වීම ගැටලුවයි. ඉන්දියාවේ ප්‍රාන්ත, මහ ආණ්ඩුව ස්ථාවර කරගැනීමට දක්වන පිටිවහල තීරණාත්මක සාධකයකි. තමිල්නාඩුව හා අන්ද්‍රා ප්‍රාන්තය එයින් ප්‍රමුඛය. උතුරේ දෙමළ ජනතාව ලක්ෂ ගණනක් විපතට පත්වන විට ඉන්දියාව නිහඩව සිටි බව තමිල්නාඩුව ඉන්දියානු මහ ආණ්ඩුවට නගන චෝදනාවයි. මානව හිමිකම් වැනි කරුණු ගැන වැඩි උන්නදුවක් නොදක්වන ඉන්දියාව උතුරේ ප්‍රශ්නයට විසඳුම බලය බෙදාහැරීම බව දක්වන්නේ තමිල්නාඩුවේ බලපෑම හෙයින්ය. ඉතිහාසයට අනුව පවා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර නොයෙක් ප්‍රශ්න  තිබී ඇත. චීන උපමාවකට අනුව ගෙදර ගිනි ගන්නා විට එය නිවන්නට දිය සොයාගත යුතු අසල්වැසියාගේ ළිදෙන්ය. ඉන්දියාව මෙරට සංවර්ධනය උදෙසා වැදගත් සාධකයකි. අනෙක් පැත්තෙන් ශ්‍රී ලංකාව ස්වකීය සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් චීනය කරා සමීපවෙමින් තිබේ. එය ඉන්දියාවේ බියට හේතුවූවකි. ආර්ථික බලවේග බවට පත් වෙමින් ඇති ඉන්දියාව පමණක් නොව චීනය ද අවශ්‍ය පමණට සම්බන්ධ කර ගෙන අරමුණු ඉටු කර ගැනීම අපේ දක්ෂතාවය විය යුතුය. ඉන්දියාව, චීනය, ඇමරිකාව, යුරෝපය පමණක් නොව සමස්ථ ලෝක ප්‍රජාවම එකග කරගැනීම ශ්‍රී ලංකාවේ සමාජ තත්ත්වයට හා විශේෂයෙන්  ආර්ථික අභිවෘද්ධියට වැදගත්ය. වෙළඳාම, ආයෝජන ලබාගැනීම, ණය අවශ්‍යතා සපුරාගැනීම වැනි කවර කාරණයක දී වුවත් ශ්‍රී ලංකාවට ආයතනික හා වානිජ මට්ටමින් රටවල් හා ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධ වන්නට සිදුවෙයි. මෙම සම්බන්ධතා වලදී රටට ඇති හොඳ නම හා කීර්තිය ඉතා වැදගත්ය. ලෝක ප්‍රජාව හමුවට යන විට ශ්‍රී ලංකාව සම්බන්ධ දර්ශක යහපත් තැනක පවත්වා ගත යුතුය. එය අභියෝගයකි.

රටක් වහල් විය යුතු නැත. ස්වෛරීත්වය ආරක්ෂා කරගත යුතුය. මානව හිමිකම් සමුළුවේ ''ආරක්ෂා කිරීමේ වගකීම'' අනුව ද ස්වෛරීත්වය නිර්වචනය කර ඇත. ස්වෛරීත්වය පවා යුරෝපීය ප්‍රමිතියක් බව මෙහි දී අමතක කළයුතු නැත. ස්වෛරීත්වය යනු වගකීමයි. ප්‍රජාවට වගවන ආකාරයට රටක් ක්‍රියා නොකරයි නම් එවැනි අවස්ථාවකට මැදිහත්විය හැකි බව එහි සඳහන්ය. මානව හිමිකම් කවුන්සලයේ ප්‍රතිඵලය කුමක් වුවත්, දුර දිග බලා ක්‍රියාත්මනවීම අවශ්‍යය. එහි ජය පැරදුම කුමක් නමුත් ත්‍රස්තවාදය පරාජය කළ රටේ අනාගතය සම්බන්ධයෙන් පුලුල් දැක්මක් අවශ්‍යය. ශ්‍රී ලංකාව හමුවේ ඇති අභියෝගය ඉතා සියුම් හා තීරණාත්මක එකකි.